**එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

2022.09.23 දින දක්වා දුරකථන ඇමතුම් මඟින් ලද මහජන අදහස් සහ යෝජනා සාරාංශය සහ ඒ සඳහා වූ පිළිතුරු.

| අනු අංකය | අදහස්/ යෝජනා | යෝජිත පිළිතුර |
|---|---|---|
| 1 | ද්විත්ව පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකිකයන්ට මෙම බලපත්‍ර ලබා ගත හැකි ද? | ඔව්. |
| 2 | විදේශ රටක ස්වයං සේවා නියුක්ත හෝ සමාගමක් පිහිටුවා එහි අධ්‍යක්ෂ ධූරයක් දරන ශ්‍රී ලාංකිකයන්ට මෙම බලපත්‍ර ලබා ගත හැකි ද? | විදේශීය රටේ නෛතිකව ක්‍රියාත්මක එවැනි සේවා නියුක්තියක් තුළින් උපයන ලද විදේශ විනිමය මෙරටට ප්‍රේෂණය කර ඇත්නම් එවැන්නන්ට ද මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රයක් ලබාගත හැකිය. |
| 3 | තමන් විසින් මුදල් ප්‍රේෂණය කර එම සම්පූර්ණ මුදල ම රුපියල් බවට පරිවර්තනය කර ඇත. එවිට මෙම බලපත්‍රය ලබා ගත හැකි ද? | ඔව්.<br>එවැනි අවස්ථාවක වාහනයක් ගෙන්වීමට හිමිකම් ලබන රුපියල් වලට පරිවර්තනය වී ඇති 50% ක ප්‍රේෂණ ප්‍රමාණය සඳහා බැංකුව විසින් පහසුකම් සපයනු ඇත. |
| 4 | බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ විදේශ ශ්‍රමිකයාගේ ගිණුමේ ඇත්තේ චක්‍රලේඛයේ දක්වා ඇති අවම මුදල් ප්‍රමාණයයි. ඊට වඩා වැඩි මුදලක් ඉදිරියේ ප්‍රේෂණය කිරීමේ අපේක්ෂාව මත දැනට ගිණුමේ ඇති ශේෂයට වඩා වැඩි අගයක වාහනයක් ආනයනය සඳහා බලපත්‍ර ලබා ගත හැකි ද? | නොහැක.<br>ආනයනය කිරීමට බලාපොරොත්තු වන වාහනයේ CIF අගය මෙන් දෙගුණයක් හෝ ඊට වැඩි මුදලක් ප්‍රේෂණය කළ පසුව පමණක් අයදුම් කළ හැකි ය. |
| 5 | මුදල් ප්‍රේෂණය කර ඇත්තේ සාමාන්‍ය ඉතුරුම් ගිණුමටයි. එය අදාළ කර ගත හැකි ද? | ඔව්.<br>සාමාන්‍ය ඉතුරුම් ගිණුමට පමණක් නොව විශේෂ තැන්පත් ගිණුම්, බැංකුව විසින් තහවුරු කරනු ලබන MoneyGram, Western Union වැනි මාර්ග ඔස්සේ ප්‍රේෂණය කර ඇති මුදල් ද අදාල කර ගත හැකි වේ. |
| 6 | චක්‍රලේඛයේ සටහන් කර ඇත්තේ ඩොලර් එවිය යුතු බවයි.ඩොලර් හැර වෙනත් විදේශ මුදල් වර්ග වලින් කරන ලද ප්‍රේෂණ වලංගු නොවේ ද? | වලංගු වේ.<br>බැංකුව විසින් ප්‍රේෂණ තහවුරුව ලබාදීමේ දී එය යෝග්‍ය පරිදි ගලපනු ඇත. |
| 7 | වෙනත් විදේශ මුදල් වර්ගයකින් කර ඇති ප්‍රේෂණ ඇ.ඩො. අගයට පරිවර්තනය කරන්නේ එම ප්‍රේෂණ සිදු කළ දිනයේ ඩොලරයේ අගය පදනම් කරගෙන ද නැතහොත් බැංකු ශේෂ තහවුරුව ලබා දෙන දිනයේ ඩොලරයේ අගය මත ද? | ප්‍රේෂණය සිදුකළ දිනයේ විනිමය අනුපාතය මත |

| | | |
|---|---|---|
| 8 | ශ්‍රී ලංකාවට වාහාන ආනයන කරන සමාගම් සමග මේ පිළිබඳ සාකච්ඡා කර මේ සඳහා පහසුකම් සැලසීමට වාහන ආනයනකරුවන්ගේ සංගමය දැනුවත් කර සහාය ලබා ගැනීම වඩාත් යෝග්‍ය බව | ඒ සඳහා පියවර ගෙන ඇත |
| 9 | බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර භාර දිය යුත්තේ කාට ද? තැපැල් මඟින් භාරදිය හැකි ද? ඒ පිළිබඳ පැහැදැලි තොරතුරු චක්‍රලේඛයේ ඇතුළත් නොවීම. | අවශ්‍ය ලියකියවිලි ඇතුළත් අයදුම්පත, ලේකම්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, 07 වන මහල, "මෙහෙවර පියස" කොළඹ 05 යන ලිපිනය සඳහන් කරන ලද ලිපිකවරයක බහා ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "පූර්ණ විද්‍යුත් වාහනයක් ආනයනය කිරීම සඳහා වූ අයදුම්පත" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපැල මඟින් යොමු කිරීම හෝ එම ලිපිනය පිහිටි ලේකම් කාර්යාලයට අතින් ගෙනැවිත් භාර දිම සිදු කළ හැකිය. |
| 10 | බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගාස්තු අය කරනවා ද? | නැත. |
| 11 | බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගත වන කාලය කොපමණ ද? | අඩුපාඩු නොමැති නම් සති 02 ක් තුළ |
| 12 | මෙම චක්‍රලේඛය සහ තොරතුරු විදේශ ශ්‍රමිකයන් වැඩි වශයෙන් පරිශීලනය කරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියේ ඇතුළත් නොකරන්නේ ද? | චක්‍රලේඛය හා අදාළ තොරතුරු එම වෙබ් අඩවියේ ඇතුළත් කර තිබේ. |
| 13 | විදේශ ශ්‍රමිකයන් වැඩි වශයෙන් පැමිණෙන විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළින් මෙම අයදුම්පත්‍ර හා විස්තර ලබා ගැනීමේ පහසුකම් සලසා නැත්තේ ඇයි? | ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ. |
| 14 | ගුවන් තොටුපළ ආගමන අංශය තුළ මේ පිළිබඳ ප්‍රචාරය කිරීම විස්තර අයදුම්පත් ලබා ගැනීමට පහසුකම් සැලසීම සුදුසු බව | ඊට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| 15 | අඩු වටිනාකමකට බලපත්‍රයක් සඳහා යොමු කළ අයදුම්පතක් බලපත්‍රය ලබාදීමට පෙර ඊට වඩා වැඩි වටිනාකමකින් යුතු වාහනයක් සඳහා නැවත අයදුම් කළ හැකි ද? කෙසේ ද? | ඒ සඳහා බාධාවක් නොමැත. එහි දී පළමුව ඉදිරිපත් කළ අයදුම්පත නොසලකා හැර දෙවන අයදුම්පත සලකා බලනු ලැබේ. |
| 16 | ඉහත 15 කරුණට අදාළව බලපත්‍රය නිකුත් කළ පසු ඊට වඩා වැඩි වටිනාකමක් සහිත බලපත්‍රයකට අයදුම් කළ හැකි ද? කෙසේ ද? | චක්‍රලේඛය මඟින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ඉඩ දී ඇති කාල සීමාව තුළ ඉදිරිපත් වන එවැනි ඉල්ලීමක් මුලින් නිකුත් කළ බලපත්‍රයේ සියළු පිටපත් සමඟ ඉදිරිපත් කළහොත් එය අවලංගු කර වැඩි වටිනාකම සඳහා වූ බලපත්‍රයක් නිකුත් කිරීම සලකා බලනු ලැබේ. |

| | | |
|---|---|---|
| 17 | විදේශගතව සිටින අයදුම්කරු වෙනුවෙන් බලපත්‍ර අයදුම් කටයුතු සිදු කිරීම සඳහා විදේශගත අයදුම්කරු ලබා දිය යුත්තේ ලිපියක් ද? ඇටෝර්නි බලපත්‍රයක් ද? | ඇටෝර්නි බලපත්‍රයකි. |
| 18 | මෝටර් වාහන සඳහා සලකා බලන කාලය 2023.04.30 දක්වා දීර්ඝ කළ නොහැකි ද? | නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම කාලසීමාව වෙනස් නොකෙරේ. දීර්ඝ කිරීම් පිළිබඳව පසුව සලකා බැලේ. |
| 19 | HS කේතයන් සඳහා අදාළ වන දළ බදු ප්‍රතිශත චක්‍රලේඛයේ ඇතුළත් කළ නොහැකි ද? | අපේක්ෂිත අයදුම්කරුවන්ගේ පහසුව සඳහා මෙම තොරතුරු වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. |
| 20 | ණයවර ලිපි විවෘත කිරීම පිළිබඳ විමසීම් වල දී මෙම චක්‍රලේඛය හෝ අදාළ උපදෙස් තමන් වෙත ලැබී නැති බව බැංකු පවසයි. | මේ වන විට ඊට අදාළ පියවර ගෙන ඇත. |
| 21 | ණයවර ලිපි විවෘත කිරීමකින් තොරව සෘජුව වාහනයක් ආනයනය සඳහා මෙම චක්‍රලේඛය යටතේ බලපත්‍රයක් ලබාගත නොහැකි ද? | නොහැකිය. |
| 22 | බලපත්‍රයේ වටිනාකමට වඩා වැඩියෙන් ගෙවිය යුතු මුදල පසුව ප්‍රේෂණය කර ඊට වඩා වැඩි වටිනාකමකට වාහනයක් ආනයනය කළ නොහැකි ද? | හැකි වේ.<br>එය චක්‍රලේඛයේ විධිවිධාන අදාළ කාලසීමාව තුළ සිදු විය යුතු අතර, 100% ක ප්‍රේෂණ තහවුරුවක් සමඟ අදාළ ඉල්ලීම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු ය. එහිදී මුල් බලපත්‍රය සියළු පිටපත් සමඟ අවලංගු කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| 23 | මෙම චක්‍රලේඛයේ සඳහන් කාලසීමව තුළ විශ්‍රාම යන හෝ සේවා ගිවිසුම් නිමා කරන ශ්‍රමිකයන්ට මෙම බලපත්‍රය සඳහා ඉල්ලුම් කළ හැකි ද? | ඔව්<br>අනෙකුත් සියළු අවශ්‍යතා සපුරාලීමට යටත්ව එවැන්නන්ටද බලපත්‍රය සඳහා ඉල්ලුම් කළ හැකිය. |
| 24 | ඉහත 23 කරුණට අදාළ හේතුවක් මත මෙරටට පැමිණ සිටින ශ්‍රමිකයන්ට මෙම බලපත්‍රය ලබාගත හැකි ද? | නොහැකිය. |
| 25 | විශාල විදේශ විනිමයක් ප්‍රේෂණය කර ඇති එහෙත් චක්‍රලේඛයේ සඳහන් ප්‍රේෂණ සහිත සීමාවට අදාළ නොවන ශ්‍රමිකයන්ට අවාසියක් සිදු වන බැවින් ඒ පිළිබඳ කටයුතු කිරීම. | චක්‍රලේඛයේ සඳහන් කාලසීමාවට අදාළ ප්‍රේෂණ පමණක් සලකා බැලේ. |
| 26 | එක් අයදුම්කරුවෙකුට බලපත්‍ර එකකට වැඩි සංඛ්‍යාවක් ලබාගත හැකි ද?<br>උදා:- මෝටර් කාරයක් හා යතුරු පැදියක් යන දෙක ම/ මෝටර් කාර් දෙකක්/ යතුරු පැදි දෙකක් | නොහැකිය. |

| | | |
|---|---|---|
| 27 | දේශීය නියෝජිතයෙකු හරහා ණයවර ලිපියක් විවෘත කරන විට, මුදල් ප්‍රේෂණය කළ බැංකුව හා ණයවර ලිපිය විවෘත කරන දේශීය නියෝජිතයාගේ බැංකුව වෙනස් වන අවස්ථාවක දී, ඊට අදාළ ගණුදෙනුව සිදුවන ආකාරය (මුදල් හුවමාරුව) පැහැදිලි කරන්න. | එක් එක් අයදුම්කරු තමන් මුදල් ප්‍රේෂණය කළ බැංකුව හරහා ම ණයවර ලිපි විවෘත කලයුතු වේ. |
| 28 | විදේශ ගතව සිටින ශ්‍රමිකයාගේ ප්‍රේෂණයන් ලබන ශ්‍රී ලංකාවේ සිටින ප්‍රතිලාභී පුද්ගලයා නමින් වාහන බලපත්‍රය ලබාගත හැකිද? | විදෙස්ගත ශ්‍රමිකයා නොවන වෙනත් අයකුගේ නමින් බලපත්‍රයක් නිකුත් නොකරේ . |
| 29 | ප්‍රේෂණය කර ඇති සම්පූර්ණ මුදලම රුපියල් වලට පරිවර්තනය වී ඇති හා එම මුළු මුදලම බැංකුවෙන් ආපසු ලබාගෙන ඇති අවස්ථාවක, වාහනයක් ආනයනය සඳහා 50% ක විනිමය පහසුකම සැලසීම පිණිස ප්‍රතිලාභියා වෙත ණය පහසුකමක් සලසා දීමට බැංකුවට හැකියාව පවතීද? | ප්‍රතිලාභියා වෙත ඒ සඳහා රුපියල් ණය පහසුකමක් ලබාදීම පිළිබඳව තම ණය ප්‍රතිපත්ති මත අදාල බැංකුව විසින් තීරණය කළ යුතුය. |
| 30 | විදේශයක සේවා නියුක්තිය අවසන් කර මෙරටට පැමිණ සිටින එහෙත් එම රටවල ගිණුම්වල තැන්පතු තිබෙන පුද්ගලයන්ට, එම තැන්පත් මුදල් මෙරටට ප්‍රේෂණය කර බලපත්‍ර යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභියෙකු වීමේ හැකියාව පවතීද? | ඒ සඳහා හැකියාව නොමැත. |